

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2021

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංක 280

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංක 280

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක නැංවීමේ සාරාංශය

1.1 හැදින්වීම

කඩිනම් සංවර්ධන ප්‍රයත්නයන්ට සමගාමීව සහ රාජ්‍ය ආයෝජන උපායමාර්ගයන්ට අනුකූලව දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන්වලින් අපේක්ෂිත ප්‍රතිඵල එකඟවූ පිරිවැය හා කාලරාමුව තුළ සාක්ෂාත් කර ගැනීම සඳහා සුවිශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍යවේ. එබැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අවහිරතා ඉවත් කිරීම සම්බන්ධයෙන් නිසිකල්හි තාර්කික හා දැනුවත් තීරණ ගැනීමට හැකිවන පරිදි එම ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය අදාළ පාර්ශවයන් වෙත වාර්තා කිරීම මෙන්ම පහසුකම් සැලසීම කළයුතුවේ. එබැවින් , සම්පත් කාර්යක්ෂමව සහ ප්‍රශස්තව රාජ්‍ය ආයෝජනයෙහි යෙදවීම සහතික කරනු වස් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ ක්‍රියාවලීන් වඩා වැදගත්වී තිබේ. මෙම මූඛ්‍ය අරමුණ ඉටුකරගැනීම පිණිස ව්‍යාපෘති සුමටව සහ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අදාළ අධීක්ෂණය, උපදේශනය හා පහසුකම් සැලසීම ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම මෙහෙවර සහ අරමුණු

දැක්ම

සඵලදායී සංවර්ධනයක් කරා

මෙහෙවර

අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය සහතික කරනුවස් සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය, ඇගයීම සහ පහසුකම් සැලසීම මෙන්ම ක්‍රියාත්මක කරනු ලබන ආයතන වෙත උපදේශනය ලබාදීම.

අරමුණු

සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම තුලින්එ එකග වූ කාලරාමුව සහ පිරිවැය තුල අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. දේශීය සහ විදේශීය මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්හි තොරතුරු එක්රැස්කිරීම,විශ්ලේෂණයහා අධීක්ෂණය.
2. මහා සහ විශාල පරිමාණයේ ව්‍යාපෘති හා වැඩසටහන්හි කාර්යසාධනය කාර්තුමය වශයෙවන් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම.
3. විදේශ මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ වැඩසටහන්හි ප්‍රගතිය සමාලෝචනය සඳහා සංවර්ධන පාර්ශවකරුවන් වෙත පහසුකම් සැලසීම.
4. තෝරාගත් විදේශ මූල්‍යයනය සහිත ව්‍යාපෘතින්හි ප්‍රතිඵල අත්පත් කරගැනීමේ ප්‍රගතිය සත්‍යාපනය කිරීම හා මූල්‍ය ආධාර සපයනු ලබන ආයතනවලට එම ණයවාරික නිදහස්කල හැකිවන පරිදි ව්‍යාපෘතිවල ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහතික කිරීම.
5. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම.
6. විවිධ පාර්ශවයන් විසින් කරනු ලබන ඉල්ලීම් මත පදනම්ව ව්‍යාපෘති ඇගයීම් සිදුකිරීම හා ඒතුලින් සැලසුම් ක්‍රියාවලිය සඳහා නිර්දේශ ලබාදීම.
7. ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය අධීක්ෂණය කර මූල්‍ය අවශ්‍යතාවන් නිර්දේශ කිරීම තුළින් භාණ්ඩාගාර මූල්‍ය ප්‍රවාහ ක්‍රියාවලියට පහසුකම් සැපයීම.
8. සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල කාර්ය සාධන වාර්තා ප්‍රකාශයට පත්කිරීම තුලින් සංවර්ධන තොරතුරු බෙදා හැරීම.

1.4 සංවිධාන සටහන (ඇමුණුම - 1)

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

තාක්ෂණික අංශ 07 ක් සහ සහාය අංශ 03 කින් සමන්විත ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක අධ්‍යක්ෂජනරාල්වරුන් පස් දෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ පහත පරිදි ව්‍යුහගත වී ඇත.

තාක්ෂණිකඅංශ

i. කර්මාන්ත සහ මූල්‍ය
ii. ජලසම්පාදන සහ විදුලිබල
iii. කෘෂිකර්ම හා වාරිමාර්ග
iv. අධ්‍යාපන හා සෞඛ්‍ය
v. ප්‍රාදේශීය හා පළාත් සංවර්ධන
vi. ප්‍රවාහන හා මහාමාර්ග
vii. රාජ්‍ය පරිපාලනය

සහායඅංශ

i. ආයතන
ii. මුදල්
iii. තොරතුරු තාක්ෂණ

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය හා වාර්තා කිරීම.

සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය, සමස්ථ වර්ෂය පුරාම දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන එක් ප්‍රධාන කාර්යයක් වන අතර එම ප්‍රගතිය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීරකයන් දැනුවත් කිරීම කාර්තුමය වශයෙන් සිදු කරනු ලැබේ. ගෝලීය සෞඛ්‍ය වසංගතය මර්ධනය සම්බන්ධයෙන්වූ උපායමාර්ගයන් වන අගුළුලා දැමීම, සමූහ නිරෝධානය, සමාජ දුරස්ථභාවය, මාර්ගගත ක්‍රමය අනුව නිවස්නව රාජකාරි සිදුකිරීම හේතුවෙන් 2021 වර්ෂයේදී, සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය දෙපාර්තමේන්තුවට අභියෝගාත්මක විය. එම අභියෝග මධ්‍යයේ වුවද දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයට නියමිත ප්‍රගති අධීක්ෂණ කටයුතු සිදුකර ඒ සම්බන්ධ නිරීක්ෂණ ඇතුලත් පළමු, දෙවන, තෙවන හා සිවුවන කාර්තුවලට අදාළ ප්‍රගති වාර්තා හා අනෙකුත් වාර්තා සම්පින්ඩනය කර නිර්දේශයන් සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට සමත් විය.

2021 වර්ෂයේ දේශීය හා විදේශීය මූල්‍යයනය මත විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මකවූ විශාල සහ මහා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව 325 ක් වූ අතර, එයට විශාල පරිමාණ ව්‍යාපෘති 210 ක් හා මහා පරිමාණ ව්‍යාපෘති 115 ක් අයත් විය. මෙම ව්‍යාපෘති 325 අමාත්‍යාංශ 47 ක් මඟින් ක්‍රියාත්මක වූ අතර එම අමාත්‍යාංශ වෙතින් මාසිකව ව්‍යාපෘති ක්‍රියාත්මක කරණයේ සංවර්ධන දත්ත ලබා ගැනීම සිදුකෙරේ. මෙම විශාල සහ මහා පරිමාණ ව්‍යාපෘති අතරින්, 187 ක් දේශීය ණය හා අරමුදල් මඟින් හා ව්‍යාපෘති 138 ක් විදේශීය ණය හා ප්‍රදාන මඟින් මූල්‍යනය කර ඇත.

වසංගත තත්වය සමගම උද්ගත වූ අභියෝගාත්මක මූල්‍ය අස්ථාවරත්වය, ඉදිකිරීම් ද්‍රව්‍යවල හිඟතාවය සහ ආනයන සීමා යනාදී අවහිරතාවයන් මාධ්‍යයේ වුවද, 2021 සිව්වන කාර්තුව අවසන් වන විට නිමකිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 89 ක් අතරින් ව්‍යාපෘති 32 ක් අවසන් ව්‍යාපෘති ප්‍රතිඵලය ජනනය කිරීමට සමත්ව තිබිණි.

වගුව 2.1 : සමස්ථ පිරිවැය අනුව ව්‍යාපෘති වර්ගීකරණය

සමස්ථ පිරිවැය අනුව මහා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති වර්ගීකරණය						
ඇස්තමේන්තුගත ව්‍යාපෘති වටිනාකම (රු.මි.)	1000-15000	15001-30000	30001-45000	45001-60000	60000 ට වැඩි	එකතුව
ව්‍යාපෘති සංඛ්‍යාව	243	41	16	9	16	325
විදේශීය	81	29	13	8	7	138
දේශීය	162	12	3	1	9	187

ප්‍රගති අධීක්ෂණ කාර්යයේදී දත්ත රැස්කිරීමේ ප්‍රධාන මාධ්‍යයක්වූ දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ජාතික ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය නව තාක්ෂණ යොදා ගනිමින් නවීකරණයට ගත් ක්‍රියාමාර්ග වසංගත තත්වය මත අපේක්ෂා කළ පරිදි නිම කිරීමට නොහැකි වීම හේතුවෙන් 2021 වර්ෂයේ දී ද ව්‍යාපෘති සමාලෝචනය, වාර්තා කිරීම, සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු අදාල පාර්ශවයන් සම්බන්ධ කර විසඳා දීම සඳහා විශේෂ ප්‍රයත්නයක් දැරීමට සිදු විය.

ප්‍රගති සමාලෝචන ක්‍රියාවලියේදී හඳුනාගත් සමහර ව්‍යාපෘතීන්හි පවත්නා ගැටළු විසඳීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. එමනිසා ව්‍යාපෘතීන්හි සත්‍ය තත්ත්වය අනාවරණය කර

ගැනීම පිණිස රේඛීය අමාත්‍යාංශ මඟින් ලබාදෙන මාසික හා කාර්තුමය වාර්තා සහ පාර්ශවකරුවන් සමඟ පවත්වන ව්‍යාපෘති කාර්යසාධන රැස්වීම් පමණක් ප්‍රමාණවත් නොවන අතර, ක්ෂේත්‍ර චාරිකා වල නිරත වීම තුළින් ලබා ගන්නා නිරීක්ෂණ බෙහෙවින් වැදගත්වේ. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව විසින් සෑම වර්ෂ ආරම්භයකදීම එකිනෙක අංශයන් යටතේ ක්ෂේත්‍ර චාරිකා සැලැස්ම පිළියෙල කරනු ලබයි. කෙසේ වුවද, රට තුළ පැවති කොවිඩ් වසංගත තත්වය හා බැදුණු සංචරණ සීමා / ඇදිරිනීති තත්වයන් යටතේ 2021 වර්ෂයට ඉලක්ක කරන ලද ක්ෂේත්‍ර චාරිකා වලින් අඩකට ආසන්න ප්‍රමාණයක් පමණක් ආවරණය කිරීමට හැකිවිය. ඒ අනුව සැලසුම් කරන ලද ක්ෂේත්‍ර චාරිකා පනස් එක අතරින් සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ක්ෂේත්‍ර අධීක්ෂණ චාරිකා විසි දෙකක් පමණක් ක්‍රියාත්මක කරන ලදී.

ක්ෂේත්‍ර අධීක්ෂණ

1. සෞඛ්‍ය හා අධ්‍යාපන අංශය



ගාල්ල, හෙල්මුට් කෝල් මාතෘ රෝහල ඉදිකිරීම



හපුගල, නැව් ගත කිරීම හා නාවික අධ්‍යයන ආයතනය ඉදි කිරීම (රුහුණු විශ්ව

2. ජලසම්පාදන අංශය



විල්ගමුව ජල තුමුළුව ඉදිකිරීම



විල්ගමුව, ජල පවිත්‍රාගාරය ඉදිකිරීම



ගම්පහ අත්තනගල්ල මිනුවන්ගොඩ
ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය



ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු
කිරීමේ ව්‍යාපෘතිය - ගලිගමුව

3. ප්‍රවාහන හා මහාමාර්ග - වරාය ප්‍රවේශය සඳහා වූ උස් අධිවේගී මාර්ගය ඉදිකිරීම





4. නගර සංවර්ධන හා නිවාස ක්ෂේත්‍රය



කොලොඹගේ මාවත, නිවාස ව්‍යාපෘතිය



කාලිංග මාවත, නිවාස ව්‍යාපෘතිය

5. කෘෂිකර්ම හා වාරිමාර්ග



වෙල්ලමන්කරය, නව ධීවර වරාය ඉදිකිරීම



වෙන්නප්පුව, කිරි ගොවීන්ගේ සමුපකාර සමිති සංවර්ධනය

වගුව 2.2 : ප්‍රගතිය ක්ෂේත්‍ර චාරිකා මගින් අධීක්ෂණය
(2021.01.01 සිට 2021.12.31 දින දක්වා)

අංශය/ ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර අධීක්ෂණය සඳහා සැලසුම් කළ ව්‍යාපෘති සංඛ්‍යාව	ක්ෂේත්‍ර අධීක්ෂණය සිදු කළ ව්‍යාපෘති සංඛ්‍යාව	අදාල ආයතන වෙත යොමුකරන ලද අධීක්ෂණ වාර්තා සංඛ්‍යාව
ජලසම්පාදන සහ විදුලි බල	9	4	4
කෘෂිකර්ම හා වාරිමාර්ග	7	3	3
අධ්‍යාපන හා සෞඛ්‍ය	17	12	12
ප්‍රවාහන හා මහාමාර්ග	8	1	1
ප්‍රාදේශීය, පළාත් සංවර්ධන හා රාජ්‍ය පරිපාලනය	8	2	2
මුදල් හා කර්මාන්ත	2	-	-
මුළු එකතුව	**51**	**22**	**22**

විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම

නව මූල්‍ය ප්‍රභවයන්, ව්‍යුහාත්මක කරුණු, සවිස්තරාත්මක සංවර්ධන විකල්ප යෝජනා සහ නව ව්‍යාපෘති ප්‍රවේශයන් හි පවතින ව්‍යාපෘති ගැටළු සමාලෝචනය කිරීම සඳහා මෙන්ම ව්‍යාපෘති කඩිනම් කිරීම තුළින් රාජ්‍ය ආයෝජනයන්හි අපේක්ෂිත ප්‍රතිඵල කාලීනව ජනනය වූ බවට තහවුරු කර ගැනීමේද අරමුණු ඇතිව දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්, කොන්ත්‍රාත්කරුවන්, සංවර්ධන පාර්ශවකරුවන්, රේඛීය අමාත්‍යාංශ නිලධාරීන් සහ මුදල් අමාත්‍යාංශයේ අනෙකුත් දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගේද සහභාගිත්වයෙන් විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පවත්වනු ලබයි.

තවද, 2021 වර්ෂය සමස්තයක් ලෙස සලකා බැලීමේදී රට තුළ පැවති කොවිඩ් වසංගත තත්වය තුළ, සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලවෙමින්, මෙම දෙපාර්තමේන්තුව මගින් අනෙකුත් ආයතන වල නිලධාරීන්ගේද සහභාගිත්වයෙන් යුක්තව විශේෂ රැස්වීම් සහ සාකච්ඡා 48 ක් සිදු කළ අතර එමගින් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේ මූලික කටයුතු, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ අන්තර්-ආයතන ගැටලු විසඳීම යනාදී කටයුතු විධිමත් කිරීමට සහ කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම තුළින් අඛණ්ඩව පහසුකම් සපයන ලදී.

වගුව 2.3 : සාකච්ඡා සහ විශේෂ රැස්වීම් පැවැත්වීමේ ප්‍රගතිය (2021.01.01 සිට 2021.12.31 දින දක්වා)

රැස්වීම් / සාකච්ඡා වර්ගීකරණය	සංඛ්‍යාව
ව්‍යාපෘති ගැටලු විසඳීමේ කමිටු (CRIP) රැස්වීම්	3
විශාල හා මහා පරිමාණ ව්‍යාපෘති කඩිනම් කිරීමේ කමිටු රැස්වීම්	2
ප්‍රගති සමාලෝචන රැස්වීම්	16
ආංශික රැස්වීම්	4
ප්‍රදාන ආයතන සමඟ රැස්වීම්	6
ව්‍යාපෘති මෙහෙයුම් කමිටු / ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම්	19
වෙනත් විශේෂ රැස්වීම් / සාකච්ඡා	14
ආධාර සපයන්නන්ගේ සමාලෝචන රැස්වීම්	2
එකතුව	**66**

බොහෝ අවස්ථා වල විවිධ ගැටළු හේතුවෙන් එකඟවූ කාලය හා පිරිවැය තුල ව්‍යාපෘති නිමකිරීම අභියෝගාත්මක බව නිරීක්ෂණය වී ඇත. එබැවින් අමාත්‍ය මණ්ඩල යෝජනාවකට අනුව හිටපු මුදල්, ප්‍රාග්ධන හා රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය තුමාගේ සහභාගිත්වයෙන් හා මුදල්, මහාමාර්ග, වාරිමාර්ග,ජලසම්පාදන, බලශක්ති හා පරිසර යන ජ්‍යෙෂ්ඨ අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් සමන්විත ව්‍යාපෘති ගැටළු විසඳීම කමිටුව (CRIP) පිහිටුවීම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනය විධිමත් කිරීමට ඉවහල් විය. මෙම කමිටුව මඟින් ව්‍යාපෘති 25 ක ගැටළු විවරණයකර විසඳුම් ක්‍රියාමාර්ග වලට අවතීර්ණ විය.

ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘති සමාලෝචනයන්

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මකකරණයේදී සංවර්ධන පාර්ශවකරුවන්ගේ පහසුකම් සලසන්නකුගේ කර්තව්‍යද මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික වැඩසටහන තුළ ඇති ප්‍රධාන අංගයක් වේ. සංවර්ධන පාර්ශවකරුවන් හයදෙනෙකු සමඟ වාර්ෂිකව සිදුකරන සමාලෝචන ක්‍රියාවලිය මඟින්ද ව්‍යාපෘති කඩිනම් කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල කාලීනව අත්කර ගැනීම තහවුරු කෙරේ.

ඒ අනුව, 2021 වර්ෂයේ ආසියානු සංවර්ධන බැංකුව (ADB), හා ඉන්දියානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 29 ක් මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රගති සමාලෝචනයන් සිදුකරන ලදී. එමගින් ව්‍යාපෘතිවල පවතින අභියෝගාත්මක ප්‍රශ්න අදාළ බලධාරීන්ගේ අවධානයට යොමු කිරීම මගින් ඵලදායී ව්‍යාපෘති කළමනාකරණයක් සඳහා දායකවී ඇත. සමකාලීනව උද්ගත වූ වසංගත තත්වය මත සැලසුම් කළ පරිදි අනෙකුත් සංවර්ධන පාර්ශවකරුවන් සමඟ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘති සමාලෝචනයන් පැවැත්වීමට නොහැකි විය.

ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව සැකසීමේ ප්‍රගතිය

විවිධ ආයතන නියෝජනය කළ ඉහළ රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම අනුව ඇගයීම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවක් පත්කර එහි මහපෙන්වීම හා සහාය මත මෙම දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය සකස් කර ගරු අග්‍රාමාත්‍ය තුමාගේ ප්‍රධානත්වයෙන් එළි දක්වන ලදි.

කෙසේ වුවද, මෙම ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන්, ප්‍රමිතීන්, ඇගයීම් ආචාරධර්ම ආයතනික ව්‍යුහයන්, ඇගයීම් න්‍යාය පත්‍ර, විධික්‍රම උපායමාර්ගික ප්‍රවේශයන් ඇතුලත් කර ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව සකස් කිරීම අමාත්‍ය මණ්ඩල නියෝගයන් මත ආරම්භ කරන ලදී. ඉහත මෙහෙයුම් කමිටුවේ නිර්දේශය මත දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුවේ ඉංග්‍රීසි මාධ්‍ය පිටපත 2020 වර්ෂයේදී කෙටුම්පත් කර අවසන් කරන ලදී. මෙම ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව ප්‍රකාශයට පත් කිරීමට සූදානම්ව පවතී.

ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය

ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණයෙහි ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් විමධ්‍යගත අරමුදල් යටතේ දිස්ත්‍රික්ක 25 තුළ ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය ජාතික මට්ටමින් විශ්ලේෂණය කර අදාල ආයතන වෙත වාර්තා කිරීමේ වගකීම මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

පැවති කොවිඩ් වසංගත තත්වය යටතේ වුවද 2021 වසරේ දී ඉහත වැඩසටහන දීප ව්‍යාප්තව සාර්ථකව ක්‍රියාත්මක වූ අතර සමස්ථ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 යටතේ හඳුනාගත් ව්‍යාපෘතින් 30,767 ක් අතුරින් ව්‍යාපෘති 30,193 ක් සාර්ථකව ජනතා අයිතියට පත්කරනු ලැබීය. මෙය ඉදිකිරීම් ව්‍යාපෘති 10,871 කින් හා ප්‍රසම්පාදන ව්‍යාපෘති 19,322 කින් සමන්විත විය. ඉහත වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලැබූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව මිලියන 07 ඉක්මවීය.

ඒ අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල ක්‍රමසම්පාදන ඒකක සම්බන්ධීකරණය කිරීම මඟින් ලබා ගන්නා තොරතුරු මත පදනම්ව මෙම ව්‍යාපෘතින්හී ක්‍රියාකාරීත්වය පිළිබඳව තත්ව වාර්තාවන් 4ක් අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යාංශය හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල ප්‍රගතිය ප්‍රකාශයට පත් කිරීම.

සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල කාර්යසාධනය පිළිබඳ ප්‍රගති වාර්තාවන් මෙම දෙපාර්තමේන්තුවේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලය වෙත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කරන ලදී. ඒ සමඟ අමාත්‍ය මණ්ඩලය ලබාදුන් තීරණ සමඟින් සෑම කාර්තුවක් අවසානයේදීම අමාත්‍යාංශ ලේකම් වරුන් වෙත සිය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතීන් පිළිබඳ මෙම දෙපාර්තමේන්තුවේ ඇගයීම් හා නිරීක්ෂණ දැනුම් දීමට කටයුතු කර ඇත.

රාජ්‍ය වියදම් සහ සම්පත් වල කාර්යක්ෂම හා ඵලදායී උපයෝජනය පිළිබඳ තොරතුරු මහජනයාට, සිවිල් සංවිධාන සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට පහසුවෙන් ලබාගත හැකිවන පරිදි අදාළ ප්‍රගති වාර්තා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (www.pmm.gov.lk) ප්‍රකාශයට පත්කර ඇත.

3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 අයවැය තොරතුරු

2021 වර්ෂය සඳහා අනුමත වූ වියදම් ඇස්තමේන්තුව සහ 2021 වර්ෂය සඳහා වියදම් ප්‍රස්ථාර අංක 01 සහ වගුව අංක 3.1 මඟින් ඉදිරිපත් කෙරේ.

වගුව 3.1 : අයවැය තොරතුරු (2021.12.31 දිනට)
ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - (රු.මී.)

කාණ්ඩය	ඇස්තමේන්තුගත වියදම	සත්‍ය වියදම
පුනරාවර්තන වියදම්	98.51	88.70
ප්‍රාග්ධන වියදම්	60.18	17.93
මුළුඑකතුව	**158.69**	**106.63**

ප්‍රස්ථාර අංක 3.1 : අයවැය තොරතුරු - 2021.12.31 දිනට



3.2 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය



ඒකීඒ-ඒ

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	ඝනය 2021 රු.	ඝනය සැලසුම් ලද 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒකීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අලුම්		117,219,000.00	91,370,000.00	ඒකීඒ-3
-	තැන්පතු		740,202	59,865.00	ඒකීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		6,218,320	5,819,387.00	ඒකීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		3,610,574	3,638,023.00	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		127,788,096	100,887,275.00	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		127,788,096	100,887,275.00	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		13,650,704	76,673.00	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		114,137,392	100,810,602.00	
	අඩු කළා : වියදම්				
-	ප්‍රකාශවර්තන වියදම්		-	-	
68,550,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	60,687,762	63,193,482.00	
29,260,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	27,524,279	28,467,557.00	ඒකීඒ-2(අ)
700,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	490,082	727,359.00	
-	සොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් ප්‍රකාශවර්තන වියදම්	9	-	-	
98,510,000.00	මුළු ප්‍රකාශවර්තන වියදම් (ඊ)		88,702,123	92,388,398.00	
	මූලධන වියදම්				
3,000,000.00	මූලධන වත්කම් ප්‍රගාරුත්වයාගය හා වැඩිදියුණු කිරීම්	10	211,377	218,320.00	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒකීඒ-2(ආ)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
3,900,000.00	භාණ්ඩ වර්ධනය	14	148,000	50,000.00	
213,280,000.00	වෙනත් මූලධන වියදම්	15	17,574,566	1,474,959.00	
220,180,000.00	මුළු මූලධන වියදම් (උ)		17,933,943	1,743,279.00	
	සැන්පතු ගෙවීම්		65,008	58,865.00	ඒකීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		8,007,519	3,620,362.00	ඒකීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		8,072,527	3,679,227.00	
	මුළු වියදම් ඒ = (ඊ+උ+ඌ)		114,708,594	97,810,904.00	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඒ)		(571,202)	2,999,698	
	අදාළ පැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(571,202)	2,999,698	ඒකීඒ-7
	දෙසැම්බර් 31 දිනට අලුම් ශේෂය				ඒකීඒ-3
			(571,202)	2,999,698	

1

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



ඒසීඒ-8

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	84,310,896	68,239,102
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	12,455,454	10,665,254
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**96,766,350**	**78,904,356**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		11,779,260	10,665,254
දේපළ පිරියත හා උපකරණ සංචිතය		84,310,896	68,239,102
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	676,194	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**96,766,350**	**78,904,356**

පිටු අංක 01 සිට 35 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 36 සිට 43 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 25/02/2022	දිනය :	දිනය : 25/02/2022

බලිව්. එච්. කරුණාරත්න
ලේකම්
වෙර්ධන සම්බන්ධීකරණ හා
අධීක්ෂණ අමාත්‍යාංශය

[illegible] 2
[illegible] දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

කේ. පිරතීපන්
අධ්‍යක්ෂ
ඖෂාති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය



ඒඩිස්-බී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2021 රු.	නැවත ඇලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
මුල් බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බිලපතු		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	24,059
වෙනත් ආදායම් කිරීම් වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		3,610,574	-
අලුම් ලැබීම්		117,219,000	91,370,000
අත්තිකාරම් අයකර ගැනීම්		3,192,882	192,475
තැන්පතු ලැබීම්		740,202	58,865
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**124,762,658**	**91,645,399**
අඩුකළා : මුදල් වැය කිරීම්			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		88,205,541	84,922,555
සඟනාධාර සහ මාරුකිරීම්		490,082	727,359
වෙනත් වැය කිරීම් වෙනුවෙන් දරන ලද වියදම්		280,000	2,028,868
භාණ්ඩාගාරයට බැර වන ලද අලුම්		13,650,704	76,673
අත්තිකාරම් ගෙවීම්		4,137,380	2,088,800
තැන්පතු ගෙවීම්		65,008	57,865
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**106,828,715**	**89,902,120**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		**17,933,943**	**1,743,279**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පොළී		-	-
ලාභාංශ		-	-
ගිණුකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්		-	-
උපාය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
අඩුකළා : මුදල් වැය කිරීම්			
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්		17,933,943	1,743,279
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		**17,933,943**	**1,743,279**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)		**(17,933,943)**	**(1,743,279)**
(ඊ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)		-	-
අඩුකළා : මුදල් වැය කිරීම්			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඔ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(ඔ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඓ) = (ඇ)+(ඒ)		-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	-

3

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

නිර්නාකිරීමේ පදනම

) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

) මිනුම්කරණ පදනම්

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සම්භාව්‍ය නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මූදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

) ආදායම් හඳුනාගැනීම්

නුවමාරු හා නුවමාරු නොවන ආදායම් ලබා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මූදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම් හා මැනීම්

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

) මූදල් හා මූදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මූදල් හා මූදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මූදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම්.

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.



6

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

මෙම දෙපාර්තමේන්තුව ආදායම් එකතු කිරීමේ දෙපාර්තමේන්තුවක් නොවේ.

වගු අංක 3.2

රු. '000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද අදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
මෙම දෙපාර්තමේන්තුව ආදායම් එකතු කිරීමේ දෙපාර්තමේන්තුවක් නොවේ.					

3.7 ප්‍රතිපාදන උපයෝජන කිරීමේ කාර්ය සාධනය

වගු අංක 3.3

රු. '000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝජනය, අවසාන ප්‍රතිපාදනයෙහි % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	95, 510, 000	98, 510, 000	88, 702, 123	90
ප්‍රාග්ධන	217, 180, 000	60, 180, 000	17, 933, 943	30

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වගු අංක 3.4

රු. '000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝජන කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	මුදල් අමාත්‍යාංශය	උපාධිධාරී දීමනා ගෙවීම්	–	–	–	–

02	රාජ්‍යසේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	උපාධිධාරී දීමනා ගෙවීම්	280,000	280,000	280,000	100%
03	මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ වියදම්	–	–	–	–

3.9 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වගු අංක 3.5

රු. '000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	
9152	යන්ත්‍රෝපකරණ	84, 310, 896	84, 310, 896	-	100%
9153	ඉඩම්	-	-	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරිගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

** ** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර් ගත කර ඇත.

4 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගුව 4.1 : ආයතනයේ කාර්යසාධන දර්ශක (2021.12.31 දිනට)

විශේෂිතදර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස සත්‍ය නිමැවුම්		
	100%- 90%	75% -89%	50%-77%
ප්‍රගති සමාලෝචනය සිදුකරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘති සංඛ්‍යාව	√		
තීරණ ගැනීම පිණිස කාලීනව නිකුත් කරන ලද ප්‍රගති සමාලෝචන වාර්තා සංඛ්‍යාව	√		
ගැටළු නිරාකරණය කිරීම සඳහා විදේශීය මූල්‍යනය සපයන ආයතන සමග පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව			√
නිරතවූ ක්ෂේත්‍ර චාරිකා සහ හඳුනාගත් ගැටළු සංඛ්‍යාව			√
ජාතික ඇගයීමේ ප්‍රතිපත්ති රාමුව සැකසීමේ මට්ටම/තත්වය	√		
තෝරාගත්ව්‍යාපෘතියක්ඇගයීමේක්‍රියාවලියේ නිරතවීමේ මට්ටම/ තත්වය	මෙම ක්‍රියාකාරකම වසංගත රෝගී තත්වය හේතුවෙන් ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලදී.		
ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්හි ගැටළු සහ ප්‍රගතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව			√
කාර්ය මණ්ඩල හැකියාව සහ නිපුණතාව වර්ධනය කිරීම සඳහා යොමු කෙරුණු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	√		

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

තිරසාර සංවර්ධන අරමුණ ලභා කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල ලභා කර ගැනීමේ ප්‍රගතීන් අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් කල යුතු කාර්යභාරය වගු අංක 5.1 හි දක්වා ඇත.

වගු අංක: 5.1 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණදර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50%- 74%	75%- 100%
16	16.6 16.7 16.8 16.10	1. වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සඳහා ප්‍රවේශ වූ පාර්ශවකරුවන් ගණන	ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සැකසුම් මට්ටමේ පවතී		
		2. වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධති ප්‍රවේශයට සිදු වූ අවහිරතා පිළිබඳ වාර්තාවීම්			
		3. ඇගයීම් අනාවරණයන් සඳහා පහසු ප්‍රවේශය	√		
		4. වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතියට නියමිත අවස්ථාවේදී ප්‍රවේශයවීමට සිදු වූ අවහිරතා පිළිබඳ වාර්තාවීම්	තොරතුරු පද්ධතිය සැකසුම් මට්ටමේ පවතී		
		5. සංවර්ධන පාර්ශවකරුවන් සමඟ පැවැත්වූ ඒකාබද්ධ ව්‍යාපෘති සමාලෝචන සංඛ්‍යාව	√		
		6. සංවර්ධන පාර්ශවකරුවන් සතු තොරතුරු සඳහා ප්‍රවේශය	√		
17	17.8 17.16 17.17	1.සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් හුවමාරු වූ දත්ත පවත්වා ගැනීම			√
		2. හොඳම භාවිතයන් (ව්‍යාපෘති) පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාම		√	

6 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

2021.12.31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

වගුව 6.1 : කාර්යමණ්ඩල තොරතුරු (2021.12.31 දිනට)

කාර්ය මණ්ඩල වර්ගීකරණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්	31	24	07
තෘතීය මට්ටමේ නිලධාරීන්	04	0	04
ද්විතීය මට්ටමේ නිලධාරීන්	47	30	17
ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්	20	17	03
එකතුව	**102**	**71**	**31**

6.2 කාර්ය මණ්ඩල පුරප්පාඩු

දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 102 කින් සමන්විත විය යුතු වුවද, 2021.12.31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 71 කින් පමණක් සමන්විත විය. ඒ අනුව පැවති පුරප්පාඩු සංඛ්‍යාව 31 කි. පුරප්පාඩු වී ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සත්දෙනෙකු අතුරින් තිදෙනෙකු ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට අයත් වන අතර, ඔවුන් අතුරින් දෙදෙනෙකු අධ්‍යක්ෂ කාණ්ඩයටත්, එක් අයෙකු සහකාර අධ්‍යක්ෂ කාණ්ඩයටත් අයත්වේ. මෙම තනතුරු 03 පුරප්පාඩු වී පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට බලවත් සේ බලපා ඇති අතර, අනෙකුත් සේවා වල පැවති පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ ජ්‍යෙෂ්ඨ කාණ්ඩයේ නිලධාරීන් හැරුණු කොට අනෙකුත් සේවාවන්හි ජ්‍යෙෂ්ඨ කාණ්ඩයේ නිලධාරීන්ද මෙම දෙපාර්තමේන්තුවෙහි ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණ කාර්යයන්හි නිරත වීමේ අවස්ථාව ලැබීම නවමු අත්දැකීමක් වී ඇත.

තව ද ද්විතියික සේවක කාණ්ඩය යටතට ගැනෙන සංවර්ධන නිලධාරී පුරප්පාඩු 15 ක් පවතින නමුත්, එම ගැටලුව ද පුහුණු අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරීන් යොදා ගනිමින් විසඳා ගැනීමට කටයුතු කර ඇත. මෙම නිලධාරීන්ගේ තරුණ ජවයද රජයේ සංවර්ධන ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා වන අධීක්ෂණ ක්‍රියාවලියට දායක කර ගැනීමට මෙමගින් හැකියාව ලැබී ඇත. කෙසේ වෙතත් දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීමද පුරප්පාඩු පිරවීම සඳහා බාධාවක් වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වගුව **6.2 : සේවක පුහුණු විස්තර (2021.12.31 දිනට)**

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ත අයෝජනය (රු.මී)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
රාජ්‍ය නිලධාරීන් සහ අධීක්ෂණ හා ඇගයීම් (M&E) වෘත්තිකයන් සඳහා ඇගයීම් සැලසුම්, ක්‍රම සහ ප්‍රවේශයන්	04	04	-	-	දේශීය	**
රැකියා අරමුණු සඳහා ඉංග්‍රීසි සහතික පාඨමාලාව	08	10	1.48	-	දේශීය	**

** දේශීයව ක්‍රියාත්මක කෙරෙන පුහුණු හා වැඩසටහන් මගින් රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය වීමක් සිදුවන අතර, එමගින් දෛනික රාජකාරීන් සඳහා එම දැනුම හා හැකියාවන් අන්තර්ග්‍රහණය කිරීමට උපකාරී වේ.

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

වගුව 7.1 : අනුකූලතා වාර්තාව (2021.12.31 දිනට)

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලයි		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූලයි		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	–		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වා ගෙනයාම	අනුකූලයි		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.4	අභ්‍යන්තර විගණන වර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		

2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලයි		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ . 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූලයි		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලයි		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවත් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූලයි		
3.4	2014.05.11 දිනැති අංක 171/2001 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලයි		

4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම			
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම			
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලයි		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලයි		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලයි		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලයි		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තා වකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලයි		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලයි		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කලමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූලයි		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලයි		

8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූලයි		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	2021 වර්ෂය වන විටත් පැවැති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ කාර්ය මණ්ඩලය නිසි පරිදි සේවයට වාර්තා නොකිරීම මත අදාල වාර්තා සඳහා තොරතුරු රැස්කර නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි විය. මේ වන විට සියලු වාර්තා ඉදිරිපත් කර ඇත.	
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූලයි		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලයි		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල	අනුකූලයි		

	ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම ,	අනුකූලයි		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලයි		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලයි		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලයි		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූලයි		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූලයි		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලයි		

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට නැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලයි		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලයි		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලයි		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලයි		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලයි		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලයි		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසැඳුම් කිරීම	අනුකූලයි		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව ,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			

15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලයි		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලයි		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වා ගෙන යාම	අනුකූලයි		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලයි		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		ඉල්ලීමක් ලැබී නොමැත
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			

18.1	අංක 05/2008 හා 05/2018 (I) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ		සකස් කරමින් පවතී
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		සකස් කරමින් පවතී
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලයි		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූලයි		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලයි		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූලයි		

20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලයි		

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - සංවිධාන ව්‍යුහය 2021.12.31



(01)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීපීඩී/සී/ඩීපීඑම්එම්/2021/එල්ඒ/01 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 ජූනි 22 දින

RECEIVED
23 JUN 2022

අධ්‍යක්ෂ ජනරාල්

ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවමි.

ඩී.ඒ.ඒ. වනිගසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත : 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

(2021 නොවැම්බර් 26 දිනැති 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 9.2 ඡේදය ප්‍රකාරව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා උක්ත වාර්තාවේ පිටපතක් මේ සමඟ එවා ඇත)

2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - (කා.දැ.ස)

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ටීපීඩී/සී/ඩීපීඑමඑම/2021/එෆ්ඒ/01 මබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2022 ජූනි 22 දින

ගණන්දීමේ නිලධාරී

ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරියා වෙනුවෙන් එකතු කළ ආදායම

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.2 හා 7.10 ඡේද ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් වාර්තාකරණ ආයතන විසින් එකතු කරන ලද ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් නොකල යුතු අතර එම ආදායම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුළ ගැලපිය යුතු වූවත් රු.3,610,574 ක් වූ ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.2,475,000 ක් වටිනා මෝටර් රථයක් වෙනත් ආයතන වෙත පවරා දී තිබුණු අතර එය මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් වලින් ඉවත් කර නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු. 2,475,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.3.1 මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.6 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C) මුදල් හා හරස් සටහන් යන දෙඅංශයම සැලකිල්ලට ගෙන සෘජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කළ යුතුව තිබුණි. දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදලින් ලද අත්තිකාරම් ලැබීම් හා මුදලින් කළ අත්තිකාරම් ගෙවීම් පමණක් සැලකිල්ලට

ගෙන පිළියෙල කර තිබුණි. ඒ අනුව ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම් රු.8,007,519 ක්ද අත්තිකාරම් ලැබීම් රු.7,063,022 ක් වී තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිළිවෙලින් රු.4,137,380 ක් හා රු. 3,192,882 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම්වල වටිනාකම රු. 3,870,140 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.3.2 ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්ගේ මුදල් වැය කිරීම් ලෙස භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.17,933,943 ක වටිනාකමක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා එම වටිනාකම රු.17,785,943 ක් වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 148,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

දෙපාර්තමේන්තුව විසින් 2021 නොවැම්බර් මාසය සඳහා පිළියෙල කළ අග්‍රිම අවශ්‍යතා ලේඛනය අනුව රු.7,568,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එම මාසයේදී දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කළ අග්‍රිමය ඉක්මවා, රු.14,050,000 ක අග්‍රිම භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

2.2.1 ප්‍රතිපාදන නිෂ්ඵල වීම

වැය විෂයක් සඳහා රු.2,000,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ඉන් කිසිදු උපයෝජනයක් කර නොතිබුණි. ඒ අනුව සලසා තිබුණ සම්පූර්ණ ප්‍රතිපාදනයම මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

2.2.2 අධි ප්‍රතිපාදන සලසා ගැනීම

මූලධන වැය විෂයයන් 03 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා එකතුව රු.212,000,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන්

රු.10,683,314 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එකතුව රු.201,316,687 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වැය විෂයයන් 04 කට අදාළ බැඳීම් හා බැරකම් වශයෙන් එකතුව රු.845,000 ක් වී තිබුණත්, මූල්‍ය ප්‍රකාශන වල එය රු.12,786 ක් අඩුවෙන් රු.831,714 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) විගණනය වෙත ඉදිරිපත් කර තිබූ බැරකම් ප්‍රකාශයෙහි 2021 අගෝස්තු 16 දින ස්ථාපිත කළ සංවර්ධන හා සම්බන්ධීකරණ අමාත්‍යාංශයේ බැරකම් ලෙස රු.304,172 ක් දක්වා තිබුණි. 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන් අංක (iii) හා (iv) හි සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA 92) බැඳීම් හා බැරකම් ලෙස දක්වා නොතිබුණි.

(ඇ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය ප්‍රකාර සටහන් අංක (iii) යටතේ ඇති බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සියළුම බැඳීම් හෙළිදරව් කළ යුතු වුවද, එකතුව රු.120,000 ක් වූ බැඳීම් හෙළිදරව් කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 8.3 ඡේදය ප්‍රකාරව දෙපර්තමේන්තුවේ තැන්පතු පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2022 මැයි 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට අදාල 2021 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව රු.3,780 ක් වූ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන (viii) ට අනුව 2021 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම පිළිබඳ තත්ත්ව වාර්තාවෙහි බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 06 ට වඩා කල් ඉකුත් වූ චෙක්පත් පිළිබඳව විස්තර දක්වා නොතිබුණි.

(ඇ) 2021 අගෝස්තු 16 දින ස්ථාපිත සංවර්ධන හා සම්බන්ධීකරණ අමාත්‍යාංශයට අවශ්‍ය අරමුදල් මෙම දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයෙන් ලබා දී තිබුණි. එම අමාත්‍යාංශයට අයත් බැංකු ගිණුම සම්බන්ධයෙන් 2021 සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වූ බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.6 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

(අ) 2021 අගෝස්තු මාසයේ සිට දෙපාර්තමේන්තුවෙන් නිලධාරිනියක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ලබා පුහුණුව සඳහා අනුයුක්ත කර තිබුණි. එම නිලධාරිනියගෙන් ආපදා ණය හා උත්සව අත්තිකාරම් වශයෙන් එකතුව රු. 232,858 ක් අයවිය යුතුව පැවතුණි. 2022 මාර්තු මාසය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව විසින් එම නිලධාරියාගේ ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.

(ආ) සාමාජික ණය ලේඛනයට (CC 10) අනුව එක් නිලධාරියෙකුගෙන් අයවියුතු රු.7,562 ක ආපදා ණය ශේෂය අත්තිකාරම් ගිණුමෙහි දක්වා නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.7 වගන්තිය අනුව නිලධාරීන්ට ණය දීමේදී ණය මුදලට අදාල වාරිකය හා පොලිය ණය මුදල දුන් මාසයට පසු මාසයේ සිට අයකළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 07 දෙනෙකුගේ එකතුව රු.710,927 ණය ශේෂයට අදාළ ණය වාරික අය කර ගැනීමේදී ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.139,921 ක් වූ ණය ශේෂය වර්ෂ 6 ක කාලයක සිට පැවත එමින් තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

(ඉ) මුල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ACA – 5 ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුම්වලට අදාල උපරිම වියදම් සීමාව, අවම ලැබීම් සීමාව හා හර ශේෂයන්ගේ උපරිම සීමාව දක්වා නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරකම් 03 ක ප්‍රගතිය අත්පත් කරගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් 03 ක අරමුණු කරා ළඟා වීම සියයට 60 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් වෙනුවෙන් රු. මිලියන 298.5 ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, ප්‍රගති වාර්තාවට අනුව වියදම රු.මිලියන 81.98 ක් වී තිබුණු අතර ඒ අනුව ඉතිරිය රු.මිලියන 216.5 ක් වී තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන සැලැස්ම

2021 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි පරිගණක මිලදී ගැනීම සඳහා රු.මිලියන 10 ක්ද, දෘඩාංග හා මෘදුකාංග පද්ධතිය සඳහා රු.මිලියන 42 ක් සහ සේවා සඳහා රු.මිලියන 150 ක්ද ඇතුළුව එකතුව රු.මිලියන 202 ක් වෙබ් අඩවිය පාදක කරගත් ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතිය ප්‍රසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රසම්පාදනය 2021 ජනවාරි මාසයේ හතරවෙනි සතියෙන් ආරම්භ කර 2021 ඔක්තෝබර් පළමුවෙනි සතියෙන් අවසන් කළ යුතුව තිබුණි. නමුත් 2021 දෙසැම්බර් මාසයේ හතරවෙනි සතියේදී පරිගණක මිලදී ගැනීම සිදුකර තිබුණි. ඒ අනුව මාස 2 ක් ප්‍රමාද වී තිබුණු අතර දෘඩාංග හා මෘදුකාංග පද්ධතිය හා සේවාවන් ඉහත කාල රාමුව තුළ සිදුකිරීමට අපොහොසත් වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකර නොතිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඇතුළත් කර යාවත්කාලීන කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් රු. 2,520,000 ක් වටිනා මෝටර් රථයක් වෙනත් ආයතන වෙත විධිමත් පැවරීමකින් තොරව භාරදී තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 102 ක් වූ අතර ඉන් තනතුරු 31 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක්ද, ද්විතික මට්ටමේ තනතුරු 17 ක්ද විය.

ඩී.ඒ.ඒ.වනිගසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට